


## ප්‍රාණය යනු කුමක්ද?

ප්‍රාණය යනු එක්තරා ආකාරයක ශක්තියක් වන අතර එය ශරීරයේ බාහිර හා අභ්‍යන්තර කටයුතු ඉහළ තලයක පවත්වාගෙන යාමට එය උපකාරී වේ. අපේ ශරීරයේ ක්‍රියාත්මක වන සෑම ස්නායු උත්තේජන ක්‍රියාවක්ම විදුලි දහරාවක් වන අතර එය මොළයේ විධාන අනුව ක්‍රියා කිරීමට ශරීරයට උපකාර කරයි. යම් කෙනෙකු ශක්තිය නිසියාකාරව සමබරතාවයෙන් පවත්වාගෙන යාම මත ඔහුට ශාරීරිකව, මානසිකව හා ජීව විද්‍යාත්මකව ලබාගත හැකි උපරිම ප්‍රයෝජන රඳාපවතී.

ස්වභාවයෙන්ම මිනිසා ස්වභාවික ජීවිතයක් ගතකළ යුතුය. ඔබ ජීවත් වන පරිසරය දෙස විමසිල්ලෙන් බලා, ඔබ එවැනි ජීවිතයක් ගතකරන්නේදැයි ඔබෙන්ම ප්‍රශ්න කරගන්න. අපි කන කෑම, අපි බොන ජලය, අපි ජීවත්වන පරිසරය සහ දියුණුව හා උසස් ජීවන තත්ත්වය යන නමින් අපි පාවිච්චි කරන තාක්ෂණික මෙවලම් යනාදි සියලුම දේ පෘථිවියේ ස්වභාවික බලශක්ති ක්ෂේත්‍රය අවුල්කර තිබෙන අතර මිනිසාගේ ශරීරයේ තිබෙන බලශක්ති ක්ෂේත්‍රයෙහිද අසමබරතාවයක් ඇති කර තිබේ.

කොන්ක්‍රීට් ගොඩනැගිලිවල ජීවත්වීමට හෝ විද්‍යුත් උපකරණ අසළ ජීවත්වීමට හෝ කෘත්‍රිමව නිෂ්පාදනය කරන ලද ආහාර අනුභව කිරීමට හෝ අපේ ශරීරය නිර්මාණය වී නොමැති බව අපි දනිමු. දියුණුව හා උසස් ජීවන තත්ත්වය යන නමින් මේ දේවල් හුදු අවශ්‍යතාවයන් බවට අපි අප විසින්ම පත් කරගෙන ඇත්තෙමු.

මේ සියල්ලම අප ශරීරය ස්වභාවිකව නිෂ්පාදනය කරන චුම්බක බලශක්තියට බලපා තිබෙන අතර පෘථිවියේ බලශක්ති ක්ෂේත්‍රයද පිරිහීමට හේතු කාරකවී තිබේ. අප ශරීරයේ ස්වභාවික බලශක්තිය හීනවීම ශරීරයේ අසමබරතාවයක් ඇතිකර තිබෙන අතර එය අපි රෝග වශයෙන් අත් විඳින්නෙමු.

## ජීව බලශක්ති චිකිත්සාව යනු කුමක්ද?

ශරීරයේ පවතින ජීව බලශක්තිය නියාමනය කිරීම ජීවශක්ති චිකිත්සාව වේ. පෘථිවියේ බලශක්ති ක්ෂේත්‍රය සමඟ අපව සුසංගත කිරීම මෙම ජීව බලශක්ති චිකිත්සාවේ මූලික කාර්යය වේ. මෙය අපට සෞඛ්‍ය ප්‍රතිලාභ ගෙනදෙයි. සමහර ආකාරක ශක්ති අනෙක් ඒවාටත් වඩා ඵලදායී වේ. මිනිසාගේ ශරීරයේ යහපත සඳහා මේ එක් එක්

බලශක්ති විවිධ සංඛ්‍යාතයෙන් (frequency) කාර්යයන් වල යෙදී සිටීම ඔබට අවබෝධ කරගත හැකිවනු ඇත.

මිනිසාගේ ශරීරයේ පවතින ජීව බලශක්ති සමබරතාවය වර්ධනය කර ගැනීමට ශරීරයට ඇති හැකියාව ජීව බලශක්ති චිකිත්සාව වැඩි දියුණු කරයි. ශරීරය සතු බලශක්තිය සමබරතාවයෙන් යුතු තත්ත්වයකට හසුරුවා ගැනීමට එය උපකාරී වේ. මෙය රුධිර සංසරණය වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ශරීරය සතු ස්වභාවික රෝග සුවකරගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමට මෙය උපකාරී වේ.

## ජීව බලශක්ති චිකිත්සාව ක්‍රියා කරන්නේ කෙසේද?

අප ශරීරය ජීව බලශක්ති සෛල වලින් සෑදී ඇති බව අප දනිමු. යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ලබාගැනීමටත්, එය පවත්වාගෙන යාමටත් මුළු ශරීරය තුළම බලශක්ති සංඛ්‍යාතය (frequency) හා ප්‍රවාහය (සංසරණය) අපි ආරක්ෂා කරගත යුතුය. බලශක්ති මූලධර්මය ක්වාන්ටම් භෞතික විද්‍යාවෙන් උපත ලද්දකි. මෙම පෘථිවියේ ඇති සියලුම දේ බලශක්තියෙන් සෑදී තිබේ. අනෙකුත් දේ මෙන්ම මිනිස් ශරීරය භෞතික හා රසායනික ව්‍යුහයන්ගෙන් පමණක් සෑදී තිබෙන එකක් නොවේ. එහි ජීව බලශක්තිය සියුම් බලශක්ති ක්ෂේත්‍රයක් වශයෙන් පවතී.

අප ශරීරය නිරන්තරයෙන්ම සංඛ්‍යාත තරංග විකිරණය කරයි: අවශෝෂණය කරයි: සන්නයනය කරයි. ජීව බලශක්තිය ශරීරයට ඉතා වැදගත් වන අතර සමහර අවස්ථාවල එය, "ජීවශක්ති ක්ෂේත්‍රය" යනුවෙන්ද තවත් අවස්ථාවක, "අත්‍යවශ්‍ය බලශක්තිය" ලෙසද නම් කෙරේ. නිරෝගීභාවය ලබාගැනීමටත්, එය පවත්වාගෙන යාමටත් අපි අපේ ශරීරයේ පවතින අත්‍යවශ්‍ය බලශක්ති ප්‍රවාහය ආරක්ෂා කරගත යුතුය. නියමිත කම්පනයෙන් හා සංඛ්‍යාතයෙන් එය ගලා යා යුතුය. අවාසනාවට මානසික ආතතිය, පරිසර දූෂණය (ජංගම දුරකථන, ගුවන් විදුලිය, පරිගණකය, රූපවාහිනිය, මෛක්‍රෝවේව් උදුන) වැනි උපකරණ වලින් පිටවන විද්‍යුත් චුම්බක තරංග වලින් ඇතිවන විකිරණ ක්‍රියාවලිය සහ ව්‍යායාමයෙන් තොර ජීවන රටාව බාල තත්ත්වයෙන් යුතු ජලය හා ආහාර වැනි දේ අපේ ශරීරයේ ක්‍රියාත්මකව පවතින ජීව බලශක්ති ප්‍රවාහය හෝ සංසරණය දුර්වල කළ හැකිය නැතහොත් අවුල් කළ හැකිය. ජීව ශක්ති ගමන් මාර්ගයේ හෝ කම්පනයේ යම්කිසි අවුල් වීමක් හෝ අසමබරතාවයක් සිදුවුයේ නම් එය විසංගතියකට හෝ රෝගී තත්ත්වයකට හෝ රෝගයකට මග පාදන තත්ත්වයක් ඇතිකිරීමට හේතු කාරක විය හැකිය.

## BIO-M බලශක්ති වළල්ල (BIO-M energy Bracelet)

BIO-M බලශක්ති වළල්ල අද්විතීය නිෂ්පාදනයකි. එකතු කරන ලද දුර්ලභ ගණයේ කාන්දම්, ජර්මේනියම් සහ ඍන අයනික සංයෝජනය, ලාලිත ටයිටේනියම් වළල්ලකට ඇතුළත්කර සාදා තිබෙන නිසා මෙය පළඳින්නාට එයින් ඉහළම ප්‍රයෝජන ලබාගැනීමට අවස්ථාවක් ලැබේ.

## නියෝඩයිමියම් කාන්දමෙන් ලැබෙන ප්‍රයෝජන

නියෝඩයිමියම් පොළොවේ තිබෙන ඉතා දුර්වල ගණයේ කාන්දමක් වන අතර එයට බලශක්තිය සමබරතාවයෙන් පවත්වාගෙන යාහැකි හැකියාව තිබෙන නිසා එය නිරෝගීභාවය වර්ධනය කරයි. චුම්බක බලශක්තිය ශරීරයට යොදන අවස්ථාවේදී චුම්බක තරංග, පටකයන් ඔස්සේ ගමන්කර භෞතික විද්‍යාවේ හඳුන්වන හෝල් ආවරණය (Hall Effects) නියමය මගින් රුධිර සංසරණය උත්තේජනය කරන කාර්යයේ යෙදෙයි. එය රුධිර සංසරණය උත්තේජනය කරයි: වසා වාහිනී පද්ධතිය වැඩිදියුණු කර ස්වභාවික රෝග සුව කිරීමේ හැකියාව වර්ධනය කරයි: අවශ්‍ය කාලයෙහි, අවශ්‍ය වේලාවන්හි ශරීරයට අවශ්‍ය බලශක්තිය හැසිරවීමේ හැකියාව මෙයට තිබේ.

## ජර්මේනියම් හි ප්‍රයෝජන

යම්කිසි නිශ්චිත ගුණයන් සතු ද්‍රව්‍ය වලින් සැදුම්ලත් ජර්මේනියම්, ශරීරයේ ඇති විෂ අකර්මන්‍ය කිරීම හා අපහරණය කිරීම වැනි කාර්යයන් ඔස්සේ ශරීරය සුව වීමට බලපෑම් කරන අතර තවත් කරුණු රාශියක් කරගෙන යාමටද ශරීරයට හැකියාව ලබාදෙයි. යහපත් සෞඛ්‍ය තත්ත්වය රැකගැනීම සඳහා පාවිච්චි කරන ජින්සෙං, ඇලෝවේරා සහ සුදුලූණු වැනි බෙහෙත් පැළෑටිවල ඉහළ සාන්ද්‍රණයකින් ජර්මේනියම් අඩංගු වී තිබෙන බව සොයා ගෙන තිබේ.

ජර්මේනියම් ශරීරයේ ඉතා මූලික මට්ටමේ, එනම් සෛල මට්ටමින් ක්‍රියාකිරීම තුළින් රෝග සුවවීමේ ක්‍රියාවලියට සුවකයක්ව පවති. ජර්මේනියම් සෛලවලට ඔක්සිජන් සැපයුම වැඩිකර, බලශක්තිය උත්පාදනය කිරීමේ හැකියාව වර්ධනය කරන බව එක්රැස් කරන ලද සාධක පෙන්වා දෙයි.

BIO-M වළල්ල ඕනෑම කෙනෙකුට පැළඳිය හැකිය. එය චිකිත්සක ප්‍රයෝජන පතා හෝ ආභරණයක් වශයෙන් පැළඳගත හැකිය. මේ දෙයාකාරයෙන්ම එය ප්‍රයෝජනවත් දෙයක් වන අතර එයින් කිසිඳු අතුරු ඵලයක් ඇති වූ බව වාර්තාවී නොමැත.

## BIO-M වළල්ල පැළඳීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන

BIO-M බලශක්ති චිකිත්සාව බෙහෙත් පෙත්තක් වශයෙන් සාදා තිබුණේ නම් ලෝකයේ වෛද්‍යවරුන් විසින් නිර්දේශිත වැඩිම බෙහෙත එය විය හැකි බව කියනු ලැබේ. BIO-M ඉදරිපත් කරන අපි එක් පියවරක් ඉදිරියට ගොස් ඇත්තෙමු. මිනිසාගේ ජීවිතය යහපත් තත්ත්වයක පවත්වාගෙන යෑම සඳහා අවස්ථාවක් ලබාදීමට අපි මෙම BIO-M නිෂ්පාදනය ඔබ වෙත ගෙන එන්නෙමු.

## BIO-M චිකිත්සාව පහත සඳහන් රෝග නිවාරණය කර ගැනීමට උපකාර වී ඇති බව දැනගන්නට ලැබී තිබේ.




ශක්ති මට්ටම වැඩිකර ගැනීමට
කොලෙස්ට්‍රෝල් මට්ටම අඩු කරගැනීමට
මානසික ආතතික බලපෑමෙන් සහනය ලබා ගැනීමට
රුධිර සංසරණය වැඩි දියුණු කර ගැනීමට
හිරුවාරදයෙන් (migraine) සහනය ලබාගැනීමට
ඔසප් සමයේදී ඇතිවන අපහසුතාවයන්ගෙන් සහනය ලබාගැනීමට
පේශී වේදනා හා කැක්කුමෙන් සහනය ලබාගැනීමට
සන්ධි වේදනා (Arthritis) රක්ත ප්‍රවාහය (Rheumatism) අඩු කරගැනීමට
අත්වල ඇතිවන හිරි වැටීමෙන් (Numbness) සහනය ලබා ගැනීමට
මළබද්ධය සහ මුත්‍රා ආසාධන වළක්වා ගැනීමට
ශරීරයේ පරිවෘත්තික (Metabolism) සහ ඔරොත්තුදීමේ (Stamina) ශක්තිය වැඩිකර ගැනීමට
ඉදිමීම් (Inflammation) සහ අපස්ථිතයෙන් (varicose) සහනය ලබාගැනීමට
දියවැඩියාව සහ අධිරුධිර පීඩනය පාලනය කරගැනීමට
කලත්‍රයා සමඟ අඹුසැමි ක්‍රියාකාරීත්වය වර්ධනය කරගැනීමට
මෙය ඇදුම වළක්වයි. සෙම්ප්‍රතිශ්‍යාව හා ඉන්ෆ්ලුවෙන්සාව අඩු කරයි.

## අවවාදයයි

ශරීරය තුළ පේස් මේකර් (Pace maker) හෝ ඩෙෆිබ්රිලේටරයක් (Defibirilator) සවිකර තිබෙන්නේ නම් කිසිදු චුම්බකයක් නොපළඳින්න. ගැබ් දරන කාලයේදී මෙය පාවිච්චි කිරීමට අපි නිර්දේශ නොකරන්නෙමු.

එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික ශාරීරික ලක්ෂණ අනුව ප්‍රයෝජනය හා ගුණයන් වෙනස් විය හැකිය.

## ස්කාලා බලශක්ති පෙන්ඩනය (Scarla energy Pendent)

BIO-M ස්කාලා බලශක්ති පෙන්ඩනය ප්‍රශස්ථ සාකල්‍යවාදි සෞඛ්‍ය තත්ත්වයක් ලබාගැනීම සඳහා ශරීරයේ පරිවෘත්තිය හා සංසරණ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කරන ස්වාභාවික බලශක්තිය උත්පාදනය කරන නිෂ්පාදනයකි. මෙම පෙන්ඩනයේ අඩංගුවී තිබෙන ගිනිකඳු (volcano) පාෂාණ වලින් ලබාගත් 70කට අධික විවිධ ස්වභාවික ඛනිජද්‍රව්‍යමය ක්‍රියාකාරී සංයෝජනයන්, මෙයින් පිටකරනු ලබන ස්කාලා බලශක්තිය ප්‍රබලව හා කාර්යක්ෂමව නිකුත් කිරීම සඳහා නැනෝ තාක්ෂණය (Nano Technology) සහ තාප විචලනය ක්‍රමය යොදා ගනිමින් ප්‍රතිසංයෝජනය කරනු ලැබ තිබේ.

බලශක්ති චිකිත්සාව මානවයාව සංකීර්ණ බලශක්ති ක්ෂේත්‍රයක ජාලයක් වශයෙන් දකියි.
ශරීරයේ, ශාරීරික හා සෛලමය පද්ධතිය අන්තර් ක්‍රියාකාරීත්වයේ නියැලෙන අතර අසමබරතාවයට පත්ව තිබෙන බලශක්ති පද්ධතියට යහපත් බලපෑමක් ඇති කිරීයි. පෙන්ඩනය පැළඳ සිටින අයගේ ශරීරයට බලශක්ති සමබරතාවයක් අවශ්‍ය ප්‍රදේශ වලට බලශක්තිය විහිදුවමින් ඇතුලුවන BIO-M ස්කාලා පෙන්ඩනයෙන් ස්වභාවිකව නිකුත්වන බලශක්තිය එය ආදේශ කරමින් ක්‍රියා කරයි.

ජංගම දුරකථනය හෝ අනෙකුත් විද්‍යුත් උපකරණ වලින් පිටවන විකිරණ වැනි ඍණාත්මක බලශක්ති වලට දිනපතා නිරාවරණය වීමෙන් දුර්වල තත්ත්වයට පත්වන අපගේ ශරීරයේ බලශක්ති සමබරතාවය පවත්වාගෙන යෑමට හෝ අලුත්වැඩියා කර ගැනීමට මෙය බෙහෙවින් උපකාරීවේ.

විද්‍යාවට ස්කාලා බලශක්තියේ පැවැත්ම පිළිබඳව ධනාත්මකව පැහැදිලි කිරීමට හැකිවූයේ ඉතා මෑතකදී වන අතර එය සෞඛ්‍ය යහපත අරමුණු කරගෙන සොයා ගැනීමටත්, ඒ සඳහා යොදාගැනීමටත් අවස්ථාව ලැබුණි. ස්කාලා පෙන්ඩනය කල්පවතියි: පැළඳගැනීමට හෝ රැගෙන යාමට පහසුයි. එයින් ඔබ පානය කරන ජලයද බලශක්ති ගැන්වීමට පුළුවනි. ස්කාලා පෙන්ඩනයෙන් නිකුත්වන බලශක්තියේ හීනවීමක් සිදුවන්නේ නැත. නිසැකවම එය ඔබට ජීවිත කාලය පුරාම ස්ථිරවම බලශක්තිය ලබාදෙයි.

## ස්කාලා බලශක්තියෙන් ලැබෙන ප්‍රයෝජන

ස්කාලා අතිරේක බලශක්තිය මගින් ගුනාත්මකව වැඩි දියුණු කරන ලද ජලය, ආහාර වැනි දේවල් වලින් ශරීරයේ ෛසල වලට බොහෝ ප්‍රයෝජන ලැබේ. මෙම ආහාර ගුණාත්මකව වැඩිදියුණු කරණු ලබන නිසා එය පහසුවෙන් ශරීරයට උරාගැනීමේ ක්‍රියාවලිය සිදුවේ. ස්කාලා බලශක්තිය ක්ෂණිකව පෙන්ඩයෙන් සෛලයට මාරු කරනු ලබයි. සෛල ජාලය හරහා උත්පාදනය කරනු ලබන විද්‍යුත් ආරෝපනය ඉහළ මට්ටමකට ගෙන එනු ලබයි. උපරිම කාර්යක්ෂමතාවයෙන් පෝෂ්‍ය පදාර්ථ සෛල තුළට ඇතුළු වීමටත්, අපද්‍රව්‍ය සෛලයෙන් පිටවීමටත් මෙය ඉඩ සලසා දෙයි. ට්‍රිලියන් සංඛ්‍යාත්මක සෛල බලශක්ති ගන්වනු ලැබීමෙන්, ශරීරයේ බලශක්තිය වර්ධනනය වේ. ස්කාලා බලශක්තිය DNA සමග පවතින රසායනික බන්ධනය ශක්තිමත් කිරීමෙන් හානියට එරෙහිව ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරයි. රුධිරය පිරිසිඳු කරනු ලබන අතර සෛලමය ද්‍රව්‍යවල ක්‍රියාකාරීත්වය නිසියාකාරව පවතියි. ප්‍රතිශක්ති ක්‍රියාකාරිත්වය වර්ධනය කරයි.

මෙය,

ශක්තිය හා ඔරොත්තුදීමේ හැකියාව වැඩි කරයි.

මානසික ආතතිය, අධික වෙහෙස හා දිග ගමනින් පසු ඇතිවන විඩාව වැනි රෝග ලක්ෂණ අඩු කරයි.

රුධිර සංසරණය වැඩිදියුණු කරයි.

EMF විකිරණ බලපෑම අඩුකරයි.

ඉදිමීම අඩුකරයි.

සෛල වෙන් නොවීම වර්ධනය කරයි.

ප්‍රතිශක්තිකරණය හා නිර්නාල ග්‍රන්ථි ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරයි.

සෛල පෝෂණය හා නිර්ධූලකරණය වැඩිදියුණු කරයි.

සෛලමය පාරගම්‍යතාවය වැඩිදියුණු කරයි.

DNA වලට හානි සිදුවීමෙන් ආරක්ෂා කරයි.

වයස්ගතවීමේ ක්‍රියාවලිය මන්දනය කරයි.

පිළිකා සෛලයට එරෙහිව සටන් කරයි.

ශරීරයේ ජීව විද්‍යාත්මක ක්ෂේත්‍රය ශක්තිමත් කරයි.

ක්ෂේත්‍රගත වීම, ඒකාග්‍රතාවය, පැහැදිලි තත්ත්වය වර්ධනය කරයි.

නින්ද නොයෑමට හේතුවන බලපෑම යටපත් කරයි.

බලශක්ති ගන්වන ලද ජලය පානය කිරීමෙන් ඔබට BIO-M නිෂ්පාදනයේ ප්‍රතිඵලය හා ප්‍රයෝජන වැඩිකරගත හැකිය.



## බලශක්ති ගන්වන ලද ජලය

BIO-M නිෂ්පාදන මගින් ජලය බලශක්ති ගැන්වීමේ ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ. ජලයට කාන්දම් ශක්තිය ලබාදීම (චුම්බකගත කිරීම) සඳහා ජීව බලශක්ති චුම්බක කුරක් පාවිච්චි කළහැකිය නැතහොත් නැනෝ තාක්ෂණය මගින් ජලයට ජීව බලශක්තිය යොදන ස්කාලා බලශක්ති පෙන්ඩනය පාවිච්චි කළ හැකිය. මෙම නිෂ්පාදන දෙකම අසමසම වන අතර මේවායින් ලැබෙව ප්‍රයෝජන හා වාසි එකිනෙකට වෙනස් වේ. ජීවිතයට ජලය ලබාදෙන දායකත්වය ඉතා ප්‍රබල ස්ථානයක් උසුලයි. පෘථිවිය මත තිබෙන ද්‍රව්‍ය වලින් ජලය ආශ්චර්යමත් ස්ථානයක් දරයි. එහි ලක්ෂණය හා ව්‍යුහය ජීවිතයේ අත්තිවාරම වේ. ජීවිතයට ජලයෙන් ලැබෙන අගය ඉතා සුළුවෙන් පමණක් අවබෝධ කරගෙන තිබේ. ජලය වර්ණ රහිත, රසක් නොමැති, සුවඳක් හෝ ගඳක් නොමැති ද්‍රාවණයක් බව විද්‍යාව කියයි. එසේ නමුත් එහි තිබෙන්නාවූ ස්වභාවික තත්ත්වය යටතේ එය ප්‍රාණය තිබෙන දෙයක් බව සැළකිය යුතුය. ජලය ජීවයක් ඇති ද්‍රව්‍යයක් වශයෙන් සැළකිය යුතු අතර එසේ සිතීමෙන් එය සත්‍යවශයෙන්ම කුමක්ද යන්න ගැනත්, එය කෙසේ අපේ ජීවිතයට බලපෑම් ඇති කරන්නේද යන්න ගැනත් අවබෝධ කරගත හැකිවේවි.

බලශක්ති ගන්වන ලද ජලය අණු වලට ජීවය ලබාදෙන අතර එය ඉහළ තෙතමනයෙන් යුතු තත්ත්වයට පත්වෙයි. මෙම තත්ත්වය ඔබේ ශරීරය, සුරතල් සත්වයින් හා පැළෑටි වල සෛල වලට උපරිම තෙතමනය උරාගැනීමට ඉඩ සලසයි. මෙය සුව වීමටත් සෞඛ්‍ය හා ශක්තිමත් භාවය රැකගැනීමටත් ප්‍රධාන තැනක් උසුලයි. (ජීවයක් ඇති, ප්‍රතිව්‍යුහගතකරන ලද නැතහොත් පොකුරු ප්‍රමාණයකට අසුරන ලද) පිරිසිඳු කාන්දම් මගින් ශක්තිගන්වන ලද ජලය අපගේ ශරීරය, සුරතල් සතුන් හා පැළෑටිවල සෛලවලට උපරිම තෙතමනය උරාගැනීමට මග පාදයි.

මිනිස් ශරීරය 70% ජලයෙන් සමන්විත වී තිබුණද, ඔබේ අභ්‍යන්තරය ජලය විසින් පිරිසිදු කරන විට ශරීරයට රසායනික නව ජීවයක් ලබා දීමට හැකිවේවි. (පරිසර දූෂණයට ලක් නොවූ, බලශක්ති ගන්වන ලද හා ජීවය ලබාදෙන) උසස් තත්ත්වයෙන් යුතු ජලය ඔබේ ශරීරයට ලබා දීමේදී එය ශරීරයට ක්ෂණිකව උරා ගනු ලැබේ. සෑම සෛලයක්ම නියම ආකාරයට ජලය උරාගැනීමට සලස්වනු ලැබේ. නියම ආකාරයෙන් සිදුවන ජලය උරාගැනීමේ ක්‍රියාවලිය හේතුකොටගෙන නියමිත පෝෂණ උරාගැනීමටද ජීවියෙකු ශරීරයේ නිෂ්පාදනය කරගන්නා විෂ ද්‍රව්‍ය ඉවත් කිරීමටද උපකාර වීමෙන් සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කරයි. මෙය ශක්තිමත් රෝග වළක්වන ප්‍රතිශක්තිකරන පද්ධතියක්, වර්ධනයවූ ජවයක් හා රෝග හා අපහසුතාවයන් අවසන් කරගැනීම සංවර්ධනය කරගැනීමේ හැකියාව ආදි ප්‍රයෝජනයන් ලබාගැනීමටද මග පාදයි.

BIO-M චිකිත්සක නිෂ්පාදන ස්වභාවිකයි, සරලයි, ආරක්ෂාකාරියි. සාධාරණ මිලෙන් යුක්තයි. එය ආභරණයක් ලෙස බාහිරව භාවිතා කළ හැකිය. ආක්‍රමණික නොවන සුළුය. එය සම්පූර්ණයෙන්ම අතුරුඵල වලින් නිදහස් චිකිත්සක ක්‍රමයකි. සුවවීමට චිකිත්සාව පමණක්ම වගකීම නොදරයි. නමුත් එය විසින් අප ශරීරය ස්වභාවිකව සුව කර ගැනීමට අප ශරීරයේ තිබෙන්නාවූ අභ්‍යන්තර සුවවීමේ ක්‍රමික හැකියාව උත්තේජනය කරනු ලබයි.